# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2469/18 - 2026 ජනවාරි මස 01 වැනි බ්‍රහස්පතින්දා - 2026.01.01**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය - 2026

**මැතිවරණ කොමිෂන් සභාවේ නිවේදනය**

2026 වර්ෂය සඳහා ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධන කටයුතු 2026 ජනවාරි මස 01 වන දින ආරම්භ කරන බව 2021 අංක 22 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ (මින් ඉදිරියට ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනත හෝ පනත ලෙස හඳුන්වනු ලබන) 12(1) වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලැබේ.

02. දැනට වලංගුව පවතින 2025 වර්ෂයේ ප්‍රධාන ඡන්දහිමි නාමලේඛනය, 2025(1) සහ 2025(2) පරිපූරක ඡන්දහිමි නාමලේඛන (මින් ඉදිරියට "වලංගු ඡන්දහිමි නාමලේඛනය" ලෙස හඳුන්වනු ලබන) හෝ ඒවායේ කොටස්වල පිටපත් ලියාපදිංචි කිරීමේ නිලධාරීන් විසින් පහත දැක්වෙන කාර්යාලවලදී ප්‍රදර්ශනය කරනු ඇත :

| **නාමලේඛනවල හෝ ඒවායේ කොටස්වල පිටපත් ප්‍රදර්ශනය කරනු ලබන කාර්යාල** | **ප්‍රදර්ශනය කරනු ලබන නාමලේඛන හෝ ඒවායේ කොටස්** |
| --- | --- |
| දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල | මැතිවරණ කොට්ඨාසයට / පරිපාලන දිස්ත්‍රික්කයට අදාළ වලංගු ඡන්දහිමි නාමලේඛනයේ සම්පූර්ණ පිටපත |
| ග්‍රාම නිලධාරි කාර්යාල | ග්‍රාම නිලධාරි කොට්ඨාසයෙහි වලංගු ඡන්දහිමි නාමලේඛන කොටස |

03. මේ අනුව යම් මැතිවරණ කොට්ඨාසයක ඡන්දහිමියෙකු වීමට සුදුසුකම් ඇති සෑම තැනැත්තෙකුටම සිය නම ඉහත ස්ථානවල ප්‍රදර්ශනය කරන ඡන්දහිමි නාමලේඛන පරීක්ෂාකර බලා නිසැක විය හැකිය. ඊට අමතරව *ec.lk/vrd* මැතිවරණ කොමිෂන් සභාවෙහි වෙබ් අඩවියට පිවිස පරීක්ෂා කළ හැක. මෙම දැන්වීමෙහි ඇති QR කේතය පරිලෝකනය (scan) කර ද තොරතුරු ලබාගත හැක.

1A - G 7443 — 18 (2026/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

04. 2026 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය පහත සඳහන් අයුරින් සිදුකිරීමට මැතිවරණ කොමිෂන් සභාව තීරණය කර ඇති බව මහජනතාව වෙත දැනුම් දෙනු ලැබේ.

05. 2025.10.31 දින සහතික කරන ලද 2025 වර්ෂයේ ප්‍රධාන ඡන්දහිමි නාමලේඛනය; 2025.10.15 දින සහතික කරන ලද 2025(1) පරිපූරක ඡන්දහිමි නාමලේඛනය; 2025.10.22 දින සහතික කරන ලද 2025(2) පරිපූරක ඡන්දහිමි නාමලේඛනය සමග 2026.02.01 දින සහතික කිරීමට නියමිත 2025(3) පරිපූරක ඡන්දහිමි නාමලේඛනය සඳහා නිර්දේශිත නම් ඒකාබද්ධ කර 2026 වර්ෂය සඳහා ඡන්දහිමියන් ගණන් ගැනීම සඳහා ඒකාබද්ධ ලැයිස්තු සකස් කර ඇත.

06. එක් එක් වසමෙහි ග්‍රාම නිලධාරි එම වසමෙහි ඡන්දහිමියන් ගණන් ගැනීමේ නිලධාරි ලෙස කටයුතු කරනු ලැබේ. අවස්ථාවෝචිතව ඇතැම් කොට්ඨාසවල විශේෂ ගණන් ගැනීමේ නිලධාරින්ද යෙදවිය හැක.

07. ඡන්දහිමියන් ගණන් ගැනීම සඳහා ගණන් ගැනීමේ නිලධාරින් ගෘහයෙන් ගෘහයට යෑම පහත 08 ඡේදයට යටත්ව 2026.01.01 දින සිට ආරම්භ කරන බව දැනුම් දෙනු ලැබේ.

08. ගණන් ගැනීමේ නිලධාරි සෑම ගෘහයකටම නොපැමිණෙන අතර අවස්ථාවෝචිතව 2025 ඒකාබද්ධ ඡන්දහිමි නාමලේඛනයේ සංශෝධනයක් සිදුකළ යුතු අවස්ථාවලදී එනම්; 2026 ඒකාබද්ධ ලැයිස්තුවේ සඳහන් නමක් හෝ කිහිපයක් ඉවත්වන අවස්ථාවකදී හෝ 2026 ඒකාබද්ධ ලැයිස්තුවේ සඳහන් නොවූ නමක් හෝ කිහිපයක් ඇතුළත් කරන අවස්ථාවලදී පමණක් පැමිණෙනු ඇත. ගණන් ගැනීමේ නිලධාරි නිවසට නොපැමිණියද තමාගේ ගෘහය යටතේ නමක්/නම් ඇතුළත්වීමක් හෝ ඉවත්වීමක් සිදුවන්නේ නම් හා වලංගු නාමලේඛනයේ සඳහන් නමෙහි, ජාතික හැඳුනුම්පත් අංකයෙහි, ගෘහ අංකයෙහි සංශෝධනයක් විය යුතු නම් ගණන් ගැනීමේ නිලධාරි මුණගැසී මෙම දැන්වීමෙහි උපදෙස් පරිදි ක්‍රියාකිරීම ගෘහ මූලිකගේ වගකීමකි. කිසිදු සංශෝධනයක් සිදුකිරීමට නොමැති නම් ඡන්ද හිමියෙකු ලෙස 2025 වලංගු ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචිව තිබූ ලිපිනය යටතේ ලියාපදිංචි කිරීම සඳහා ක්‍රියා කරනු ඇත. ඒ සඳහා ගෘහමූලික විසින් කිසිදු ආකෘතියක් සම්පූර්ණ කිරීමේ අවශ්‍යතාවයක් නොමැත.

09. 2025 වර්ෂයේ ලියාපදිංචි වී ඇති ඡන්දහිමියෙකු හෝ කීපදෙනෙකු මිය යෑම හෝ පදිංචිය හැරයාම හෝ පදිංචිය වෙනස්වීම හෝ වෙනත් හේතුවක් නිසා හෝ 2026 වර්ෂයේ ලියාපදිංචිය සඳහා සුදුසුකම් නොලබන විටදී ඒ බවද ඔබගේ ගණන් ගැනීමේ නිලධාරි වෙත දැනුවත් කරන්න. මෙසේ නුසුදුසුකමට ලක්වන තැනැත්තන් 'අ' ලැයිස්තු ගත කර ප්‍රවර්ථන වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනයෙන් ඉවත් කරනු ලැබේ.

10. කිසියම් තැනැත්තෙකු 2025 වර්ෂයේ ලියාපදිංචි වී නැත්නම් හෝ වයස අවුරුදු 18 සම්පූර්ණ වීම මත ප්‍රථම වරට ඡන්ද හිමියෙකු ලෙස ලියාපදිංචි වන්නේ නම් හෝ පදිංචිය වෙනස් වීම හෝ වෙනත් හේතුවක් නිසා 2026 වර්ෂයේ ඡන්ද හිමියෙකු ලෙස ලියාපදිංචි වීම සඳහා සුදුසුකම් ලබන්නේ නම් 2026/ER ආකෘති පත්‍රයක් සම්පූර්ණ කර ගණන් ගැනීමේ නිලධාරි වෙත භාර දෙන්න. වැඩිදුර විස්තර 2026/ER ආකෘතියෙහි සඳහන්ව ඇත. වලංගු නාමලේඛනයෙහි ඇතුළත්ව නොමැති එහෙත් සුදුසුකම් ලැබීමේ ලිපිනයක් යටතේ නාමලේඛනයෙහි ඇතුළත් කරවා ගැනීමට සුදුසුකම් ලබන තැනැත්තන් 'ආ' ලැයිස්තු ගතකර 2026 නාමලේඛනයට ඇතුළත් කරනු ලැබේ.

11. 2026.02.01 දිනට වයස අවුරුදු 18 සම්පූර්ණ කරනු ලබන; එනම් 2008.01.31 දින හෝ ඊට පෙර උපත ලැබූ තැනැත්තන් 2026 වර්ෂයේ ප්‍රධාන නාමලේඛනය සඳහා ලියාපදිංචි වීමට සුදුසුකම් ලබයි.

12. වලංගු ඡන්දහිමි නාමලේඛනයේ සඳහන් නමක හෝ ජාතික හැඳුනුම්පත් අංකයෙහි යම් දෝෂයක් තිබේනම්, ජාතික හැඳුනුම්පතෙහි/උප්පැන්න සහතිකයේ පිටපතක් සමග ගණන් ගන්නා නිලධාරී වෙත හෝ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය වෙත දැන්වීම සිදු කළ යුතුවේ.

13. 2026 ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනයේදී ගණන් ගන්නා නිධාරීන් ගෙයින් ගෙට ගොස් ප්‍රතිශෝධන කටයුතු සිදු නොකරන බැවින්, තමාගේ ගෘහයට අදාළ වලංගු ඡන්දහිමි නාමලේඛනයේ ඉවත්වීම් සහ 2026 ඡන්ද හිමි නාමලේඛනයට ඇතුළත් විය යුතු නම් සම්බන්ධව ගණන් ගන්නා නිලධාරීන් වෙත අදාළ තොරතුරු ලබාදෙන ලෙස මැතිවරණ කොමිෂන් සභාව සියළු පුරවැසියන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

14. ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනත අනුව 'අ' 'ආ' ලැයිස්තු ප්‍රදර්ශනය, හිමිකම් හා විරෝධතා භාරගැනීම පිළිබඳව දැන්වීම් 2026.05.05 දින ප්‍රසිද්ධ කිරීම සඳහා සැලසුම් කර ඇත. දැන්වීම් පළකළ දින සිට දින 28ක් තුළ හිමිකම් හා විරෝධතා ඉදිරිපත් කළ යුතුයි. 2026 ප්‍රතිශෝධන අවස්ථාවේදී සුදුසුකම් සපුරා ඇති එහෙත් ER ආකෘතියට නම ඇතුළත් කර ගැනීමට නොහැකි වූ තැනැත්තන්ට මෙම කාලය තුළ හිමිකම් අයදුම්පතක් ඉදිරිපත් කළ හැකි අතර 2026 නාමලේඛනය සඳහා නුසුදුසු පුද්ගලයෙකුගේ නමක් නිර්දේශ වී ඇත්නම් විරෝධතාවයක් ඉදිරිපත් කිරීමට මෙම කාලසීමාවේදී හැකියාව ඇත. මේ සඳහා වන මුද්‍රිත ආකෘති කොට්ඨාසයේ ග්‍රාම නිලධාරීගෙන් හෝ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයෙන් ලබාගත හැක.

15. ඉදිරියේදී සහතික කිරීමට නියමිත පහත සඳහන් පරිපූරික ඡන්දහිමි නාමලේඛන 06ක් සඳහා YC ආකෘති මගින් තොරතුරු එක්රැස් කිරීම සිදුකෙරේ. පරිපූරක ලැයිස්තු ප්‍රදර්ශනය, හිමිකම් හා විරෝධතා භාරගැනීම පිළිබඳව ඉදිරියේදී ප්‍රසිද්ධ නිවේදන මගින් දැනුම් දෙනු ලැබේ.

15.1. 2026 වර්ෂය සඳහා සකස් කරනු ලබන පරිපූරක ඡන්දහිමි නාම ලේඛනය

| *පරිපූරක ඡන්දහිමි නාමලේඛනය* | *අවුරුදු 18 සම්පූර්ණ කළ යුතු කාල පරිච්ඡේදය* | *උපන් දිනය* |
|---|---|---|
| 2026(1) | 2026.02.01 සිට 2026.05.31 දක්වා | 2008.02.01 සිට 2008.05.31 දක්වා |
| 2026(2) | 2026.06.01 සිට 2026.09.30 දක්වා | 2008.06.01 සිට 2008.09.30 දක්වා |
| 2026(3) | 2026.10.01 සිට 2027.01.31 දක්වා | 2008.10.01 සිට 2009.01.31 දක්වා |

* 2026.02.01 දින සිට 2027.01.31 දක්වා වයස අවුරුදු 18 සම්පූර්ණ කරන එනම් 2008.02.01 දින සිට 2009.01.31 දක්වා උපන් තැනැත්තන් 2025 වර්ෂයේ දී ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කර ඇත්නම් සහ පදිංචියේ වෙනසක් සිදු නොවන්නේ නම්, ග්‍රාම නිලධාරි විමසා තොරතුරු තහවුරු කරගත යුතු අතර, නැවත අයදුම් කිරීම අවශ්‍ය නොවේ.

15.2. 2027 වර්ෂය සඳහා සකස් කරනු ලබන පරිපූරක ඡන්දහිමි නාම ලේඛනය

| *පරිපූරක ඡන්දහිමි නාමලේඛනය* | *අවුරුදු 18 සම්පූර්ණ කළ යුතු කාල පරිච්ඡේදය* | *උපන් දිනය* |
|---|---|---|
| 2027(1) | 2027.02.01 සිට 2027.05.31 දක්වා | 2009.02.01 සිට 2009.05.31 දක්වා |
| 2027(2) | 2027.06.01 සිට 2027.09.30 දක්වා | 2009.06.01 සිට 2009.09.30 දක්වා |
| 2027(3) | 2027.10.01 සිට 2028.01.31 දක්වා | 2009.10.01 සිට 2010.01.31 දක්වා |

**ආර්.එම්.ඒ.එල්. රත්නායක,**
සභාපති,
මැතිවරණ කොමිෂන් සභාව.
මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙන්

2026 ජනවාරි මස 01 වැනි දින,
සරණ මාවත, රාජගිරිය,
මැතිවරණ කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

EOG 01 - 0005

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.